**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව - 2019**

-------------------------------------------------------

**1.1 මතය**

**------**

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.
කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**-------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරබවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

-------------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය | විගණන හා කළමනාකරණ කමිටුව මාස 03කට වරක් හෝ කැඳවිය යුතු වුවත් කොමිෂන් සභාව විසින් 2019 වර්ෂය තුලදී විගණන කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | 2019 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් 4 ක් පැවැත්වීමට සැලසුම් කළද ජනවාරි, පෙබරවාරි සහ දෙසැම්බර් මාස වල කොමිසමක් නොතිබූ අතර අප්‍රේල් සහ මැයි මස වල කොමිෂන් සභා රැස්වීම් නොපැවැත්වීණි. විගණන කමිටු රැස්වීමකට කොමිෂන් සභාවේ සාමාජිකයින් දෙදෙනෙකුගෙන් යුත් සංයුතියක් අවශ්‍ය වේ. කොමිෂන් සභා සාමාජිකයින් දෙදෙනා ජුනි මස 201 වන රැස්වීමෙන් පත්කර ඇත. එම නිසා | 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී//12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය අනුව කටයුතු කලයුතු බව |

| | | | |
|---|---|---|---|
| | | මෙම වර්ෂයේ විගණන කමිටු රැස්වීම් 2 ක් පමණක් පැවැත්වීමට හැකි විය. | |
| (ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2010 දෙසැම්බර් 10 දිනැති අංක 1/2010 දිනැති චක්‍රලේඛයේ (1)(ඊ) වගන්තිය | රාජ්‍ය ව්‍යවසායන්හි හා විශ්ව විද්‍යාල අනධ්‍යන කාර්ය මණ්ඩලයෙහි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් දරන වසර 12 ක කාලයක් සම්පූර්ණ කර ඇති විධායක නිලධාරීන් හට තීරු බදු රහිත වාහන බලපත්‍රයක් ලබාගැනීමට හැකි බව චක්‍රලේඛයේ දක්වා ඇති අතර එයට පටහැනිව කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරයා විසින් 2011 ජුනි 08 දින තීරු බදු රහිත වාහන බලපත්‍රයක් මත වාහනයක් ආනයනය කර තිබුණි. ඔහුගේ පත්වීම් දිනය 2003 ජුලි 31 වන අතර තීරුබදු රහිත වාහනය ආනයනය කරන දිනට ඔහුගේ සේවා කාලය වසර 7 මාස 10 සහ දින 7 ක් පමණ වී තිබුණි.<br>එසේ වුවත් මේ සම්බන්ධව පරීක්ෂා කර බලා අවශ්‍ය පියවර ගැනීමට හෝ එම මුදල් වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | සභාවේ අධ්‍යක්ෂ 1999 ජනවාරි 01 දින කොන්ත්‍රාත් පදනම මත විද්‍යා වැඩසටහන් කළමණාකරු (II ශ්‍රේණිය) තනතුරට වසර දෙකක් සඳහා බඳවාගෙන ඇත. මෙම කොන්ත්‍රාත්තුව වරින් වර අඛණ්ඩව 2003 ජුලි 03 වැනි දින දක්වා ඉහත තනතුරෙහි දීර්ඝ කර ඇත. 2003 ජුලි 31 වැනි දින ඔහුට ඉහත තනතුරේ ස්ථිර පත්වීමක් ලබාදී ඇත. මේ අතර DMS 30 චක්‍රලේඛයට අනුව 2007.02.13 වැනි දිනට මොහුට MM 1-3 වැටුප් කාණ්ඩයේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහනය කර ඇත.<br>2011 වර්ෂයේ ඔහු ලබාගත් වාහන බලපත්‍ර හා සැලකීමේදී, මොහු කොන්ත්‍රාත් කාලයත් සමඟ වසර 12ක අවම සක්‍රිය සේවා කාලයක් සපුරා ඇති අතර කොන්ත්‍රාත් කාලය නොසලකා හැරියහොත් අවම වසර 12ක සේවා කාලය සපුරා නොමැත.<br>2011 වසරට අදාළ චක්‍රලේඛ TTIP/01/2010(1) හි සක්‍රිය සේවා කාලයට කොන්ත්‍රාත් කාලය අඩංගු වන/නොවන බව පැහැදිළිව දක්වා නොමැත. | භාණ්ඩාගාර ලේකම්ගේ 2010 දෙසැම්බර් 10 දිනැති අංක 1/2010 දිනැති චක්‍රලේඛයේ (1)(ඊ) වගන්තිය අනුව කටයුතු කලයුතු බව |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,347,865 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,510,610 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,858,475 ක පහත වැටීමක් නිරීක්ෂණය විය. මෙම පහත වැටීමට සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ හා සංවර්ධනය සඳහා ලබාදී ඇති ප්‍රාග්ධන ප්‍රදාන රු.10,171,825 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

කොමිෂන් සභාවේ ප්‍රධාන ආදායම් විෂයක් වන පර්යේෂණ හා සංවර්ධනය සඳහා ලබාදී ඇති ප්‍රාග්ධන ප්‍රදාන රු.10,171,825 කින් සහ පුනරාවර්තන ප්‍රදාන රු.3,554,506 කින් අඩු වී ඇති අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 76 ක සහ සියයට 12 ක පහත වැටීමකි. එයට සාපේක්ෂව පර්යේෂණ හා සංවර්ධන වියදම රු.6,375,248කින් පහත වැටී ඇත. එයට අමතරව පෞද්ගලික පඩි නඩි වියදම රු.1,017,664කින් වර්ධනය වී තිබුණි. ගමන් වියදම් සඳහා දරන ලද වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්ථන වර්ෂයේදී රු.290,465කින් අඩු වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

2019 වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් 0.51:1ක් හා 0.49:1 ක් වූ අතර 2018 වර්ෂයේදී එම අනුපාත පිළිවෙලින් 1.12:1 ක් හා 1.1:1 ක් වශයෙන් විය. 2018 වර්ෂයට සාපේකෂව සමාලෝචිත වර්ෂයේදී කාරක ප්‍රාග්ධනයේ පහත වැටීමක් පෙන්නුම් කෙරුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ අධ්‍යක්ෂකවරයා 2018 පෙබරවාරි 20 දින සිට වාහම ක්‍රියාත්මක වන පරිදි විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු කර තිබූ අතර 2018 ජුනි 19 දිනැති කොමිෂන් සභාවේ පාලක මණ්ඩල වාර්තාව අනුව 2018 ජුලි 09 දින අනිවාර්ය නිවාඩු ලබාදී තිබුණි. එබැවින් මෙම නිලධාරියා වෙත 2018 මාර්තු 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා ලෙස රු.3,036,619 ක් ගෙවා තිබූ අතර එම මුදල කොමිෂන් සභාවේ ආර්ථික නොවන වියදමක් වී තිබුණි. | ආයතනයේ හිටපු අධ්‍යක්ෂකතුමා 2018 ජුලි මස 9 වන දිනපැවති 193 කොමිෂන් සභා රැස්වීම මගින් අනිවාර්ය නිවාඩු යවන ලදී. එම කොමිෂන් සභා වාරයේදී හිටපු අධ්‍යක්ෂකතුමා හට මුලික වැටුප සහ දීමනා (ජීවන වියදම් දීමනාව සහ වෘත්තිමය දීමනාව) ගෙවීමට තීරණය කරන ලදී. ඒ අනුව එම වැටුප ගෙවීම මුලික පරීක්ෂණය අවසන් වන තෙක් එනම් 2020 ජුනි මස දක්වා ක්‍රියාත්මක විය. කොමිෂන් සභාවේ නව සභාපතිනි 2020 ජනවාරි මස 16 වැඩ භාර ගැනීමෙන් පසුව මේ සඳහා වැඩි අවධානයක් යොමු කල අතර වැඩ බලන අධ්‍යක්ෂ සමග මුලික විමර්ශන | අනිවාර්ය නිවාඩු යවා ඇති නිලධාරීයෙකුට ගෙවීම් කල හැක්කේ විනය පරීක්ෂණ අවසන් වී එහි නිර්දේශ මත පමණක් වන අතර ඒ මත ක්‍රියාකලයුතු බව. |

වාර්තාව 2020 අප්‍රේල් මස ගෙන්වා ගන්නා ලදී. එම වාර්තාවේ නිර්දේශ ජූනි මස පැවති කොමිෂන් සභාවට ඉදිරිපත් කර ස්ථිර කරන ලදී. ඒ අනුව ජූලි මස 01 දින සිට හිටපු අධ්‍යක්ෂකතුමාගේ සේවය වැටුප් රහිතව අත්හිටුවීමට සහ චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට තීරණ ක්‍රියාත්මක කරන ලදී. මූලික විමර්ශන නිලධාරි විසින් සකස් කල එම චෝදනා පත්‍රය කොමිෂන් සභාවේ අනුමැතියෙන් අධ්‍යක්ෂකතුමා වෙත යොමු කරන ලදී. මේ හා අදාළ ඉදිරි විමර්ශන ඉක්මනින් අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 කාර්යසාධනය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විද්‍යාව හා තාක්ෂණය (S&T) ආශ්‍රිත ප්‍රතිපත්ති, උපාය මාර්ග සැලසුම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන (STI) උපාය මාර්ග සංවර්ධනය කිරීමේ කටයුතුවලින් 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැසුමට අනුව නිම කළ යුතු කාර්යයන්ගෙන් සියයට 10 ක ප්‍රමාණයක කටයුතු පමණක් ඉටු කර තිබුණි. | 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනත අනුව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන්සභාව විසින් විද්‍යා හා තාක්ෂණය (S&T) ආශ්‍රිත ප්‍රතිපත්ති, උපායමාර්ග, සැලසුම් හා සංවර්ධනය කිරීමේ වැඩසටහන් සංවිධානය කර තිබිණි. 2019 වර්ෂයට අදාල, විද්‍යා හාතාක්ෂණ (S&T) නව ප්‍රතිපත්ති හඳුනාගැනීම හා ආරම්භ කිරීම සඳහා වූ වැඩපිළිවෙල 9 වන ද්විවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව හා සමගාමීව හඳුනාගැනීමට අදහස් කෙරිණි. එම 9 වන ද්විවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව 2019 මාර්තු මස පැවති 200 වන කොමිෂන් සභා රැස්වීම මගින් 2019 වර්ෂයේ නොපැවැත්වීමට තීරණය කරන ලදී.එම සමුළුව 2020 වර්ෂයේ දී පැවැත්වීමට තීරණය කරන ලදී. මේ සඳහා ආයතනයේ පැවති පරිපාලන ගැටලුව ද බලපාන ලදී. නව ප්‍රතිපත්ති හඳුනා ගැනීම හා | කොමිෂන් සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද කටයුතු ක්‍රියාත්මක කළ යුතු බව |

| | | |
|---|---|---|
| | පිළියෙල කිරීම 2020 වර්ෂයේදී සෞභාගයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව නිම කිරීමට අදහස් කරන අතර ඒ සඳහා මේ වනවිටත් සාකච්ඡා කර ඇතිබව සඳහන් කිරීමට කැමැත්තෙමු. | |
| (ආ) විද්‍යාව සහ තාක්ෂණය (S&T) සම්බන්ධව ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමට අදාල කටයුතුවලින් 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුම අනුව වර්ෂය තුලදී ඉටුකළ යුතු කටයුතුවලින් සියයට 50 ක් පමණක් අවසන් කර තිබූ බව නිරීක්ෂණය විය. | ජාතික විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන [Science, Technology and Innovation (STI)] ප්‍රතිපත්ති සංශෝධනය කිරීම 2018 වර්ෂයේදී කොමිෂන් සභාවේ අනුමැතිය අනුව ආරම්භ කල අතර, එම ප්‍රතිපත්ති 2019 වර්ෂයේදී නිම කිරීමට කටයුතු තීරණය කර තිබිණි. එහි කෙටුම්පත (Policy draft) සම්පූර්ණ කර අවසන් කර ඇති අතර එම ප්‍රතිපත්ති එලි දැක්වීම හා ප්‍රකාශනය කිරීම, 9 වන ද්වි වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව හා සමගාමීව නිමකිරීමට කටයුතු කර තිබූ නමුත් එම සමුළුව 2019 වර්ෂයේ පැවැත්වීම හා සංවිධානය නොකිරීමට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 200 වන කොමිෂන් සභා රැස්වීම මගින් තීරණය කෙරිණි. එම නිසා ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය 2019 වර්ෂයේදී එළිදැක්වීම සිදුනොවිණි. පවතින සෞඛ්‍ය තත්ත්ව යටතේ මෙම ද්විවාර්ෂික සමුළුව මේ වසර අගදී පැවැත්වීමට බලාපොරොත්තු වන අතර, සෞභාග්‍ය දැක්මේ ඉලක්ක සපුරා ගැනීම සඳහා වන මුලික කටයුතු ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව යෝජිත ජාතික විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රතිපත්තිය හෝ උපායමාර්ගික සැලසුම් ද සම්පාදනය කිරීමට බලාපොරොත්තු වේ. | කොමිෂන් සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද කටයුතු ක්‍රියාත්මක කළ යුතු බව |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකාවේ විද්‍යා සහ තාක්ෂණ (S&T) තත්ත්වය තක්සේරු කිරීමේ ව්‍යාපෘතියේ දත්ත සමුදාය (Database) සංවර්ධනය කිරීමේ ප්‍රවර්ථන වර්ෂය තුලදී සිදු කිරීමට සැලසුම් කර තිබුණද එයින් සියයට 60 ක ප්‍රමාණයක් පමණක් සමාලෝචිත වර්ෂය තලදී අවසන් කර තිබුණි. | 2018 වර්ෂයට අදාල විද්‍යා හා තාක්ෂණ තත්වයන් (S&T Status) පිලිබඳව වාර්තාව සඳහා දත්ත එක්රැස් කිරීම 2019 වර්ෂයේ අගෝස්තු මාසයෙන් පසුව සිදු කරන ලද අතර, විද්‍යා හා තාක්ෂණ ආයතනය මගින් එම දත්ත ලබාදීම ප්‍රමාද වීම හේතුවෙන් දත්ත එක්රැස් කිරීම, සම්පාදනය හා විශ්ලේෂණය කිරීම 2020 වර්ෂය දක්වා දීර්ඝ වුණි. දත්ත එක්රැස් කිරීම දැනට NSF හි තිබෙන සේවාදායක පරිගණකය (Server Computer) මගින් සිදු කරන අතර මෙම වසරේදී නස්ටෙක් ආයතනයට සේවාදායක පරිගණකයක් (Server Computer) ලබා ගැනීමට බලපොරොත්තු වේ. මෙමගින් මෙම දත්ත සමුදාය සංවර්ධනය කිරීම වඩාත් කාර්යක්ෂමව සිදු කිරීමට බලාපොරොත්තු වේ. | කොමිෂන් සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද කටයුතු ක්‍රියාත්මක කළ යුතු බව |
| (ඈ) විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන (STI) පිළිබඳව රජයට උපදෙස් දීම සඳහා පද්ධතියක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියට අදාලව ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින්, තරුණ විද්‍යාඥයින් සහ වෙනත් වෘත්තීය සංවිධානවල විද්‍යාඥයින්ගෙන් සමන්විත වැඩ කරන කණ්ඩායම් ආරම්භ කිරීමේ කටයුතුවලදී 2019 වර්ෂයේදී මෙහෙයුම් කමිටු රැස්වීම් 10 ක් පැවැත්වීමට නියමිතව තිබුණද රැස්වීම් 6 ක් පමණක් සිදුකර තිබුණි. | තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ (YSF) මෙහෙයුම් කමිටු (steering committee) රැස්වීම් 10 ක් 2019 වසරේ පැවැත්වීමට සැලසුම් කරගෙන සිටියද කමිටු සාමාජිකයන් සියල්ලෝම වෙනත් ආයතන/ විශ්වවිද්‍යාල වල රැකියාවෙහි නියුතු විද්වතුන් සහ ආචාර්යවරුන් බැවින් ඔවුන්ගේ කාර්ය බහුලත්වය හේතුවෙන් කමිටු රැස්වීම් 6 ක් පමණක් පැවැත්වීමට හැකි විය. එනමුත් මෙම තරුණ විද්‍යාඥයින්ගේ සංසදය වඩාත් ක්‍රියාකාරී ලෙස කටයුතු කරමින් බලාපොරොත්තු වූ දායකත්වය සපුරන ලදී. | කොමිෂන් සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද කටයුතු ක්‍රියාත්මක කළ යුතු බව |